## ඔබට කළ හැකි දේ

1. **සංඥා ගැන දැන ගන්න.** භාෂාවන් 17කින් ප්‍රධාන සලකුණු ලැයිස්තුගත කොට ඇති, පහසු ඔබේ පසුම්බියේ ප්‍රමාණයේ අපගේ සුවක කාඩ්පත් ඇණවුම් කරන්න. ඔබේ ප්‍රදේශයේ මෙම කාඩ්පත් බෙදා හැරිය හැකිය. එසේම, පළමු වරට ප්‍රතිචාර දක්වන පුද්ගලයින් සහ සෞඛ්‍ය සේවා සපයන්නන් හට සුදුසු සුවක කාඩ්පත් ද අප විසින් නිර්මාණය කොට තිබේ. *www.dhs.gov/Bluecampaign* යන වෙබ් අඩවියෙන් ඔබට වැඩි දුර විස්තර ඉගෙන ගත හැකිය.

2. **හෝඩුවාවන් වාර්තා කරන්න.**මිනිස් ජාවාරමමිනිස් ජාවාරමට ගොදුරු වූ තැනැත්තකු ඔබට මුණ ගැසෙන්නේ නම් හෝ ඔබ නීතිය බලාත්මක කිරීමේ යෙදී සිටින්නේ නම්, සහ ඔබේ ප්‍රදේශයේ HSI සමඟ සම්බන්ධ වීමට ඔබට අවශ්‍ය නම්, **HSI හෝඩුවාවන් පිළිබඳ ක්ෂණික දුරකථන මාර්ගය අමතන්න:**

   - (866) 347 – 2423 අමතන්න (එක්සත් ජනපදයේ සහ කැනඩාවේ සිට නම් ගාස්තු රහිතයි)
   - (802) 872 – 6199 අමතන්න (ලෝකයේ ඕනෑම ස්ථානයක සිට ගාස්තු අය කෙරේ)
   - එසේ නැත්නම්, **www.ice.gov/tips**වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගතව හෝඩුවාවන් වාර්තා කරන්න (අන්තර්ජාලයෙන් ඕනෑම ස්ථානයක සිට)

   ඉතා උසස් ලෙස පුහුණුව ලද විශේෂඥයින්, දිනකට පැය 24 පුරාවටම, සතියකට දින 7ක දී, මිනිස් ජාවාරම පිළිබඳ හෝඩුවාවන් භාර ගැනීම සඳහා මෙන්ම, රාජකාරී කටයුතු වල රට පුරා සහ ලොව වටා යෙදී සිටින මිනිස් ජාවාරම පිළිබඳ පරීක්ෂකයින් වෙත එම තොරතුරු ලබා දීමට සූදානම්ව සිටිති. මාර්ගගත පෝරමය තුළින් හෝ ගාස්තු රහිත දුරකථන මාර්ගය ඔස්සේ, ඔබට නිර්නාමික හෝඩුවාවන් වාර්තා කළ හැකිය.

   **පහත සඳහන් දේ සඳහා, 1-888-373-7888 දුරකථන අංකය ඔස්සේ නැෂනල් හියුමන් ට්‍රැෆිකිං රිසෝර්ස් සෙන්ටර් හෙවත් ජාතික මිනිස් ජාවාරම පිළිබඳ සම්පත් මධ්‍යස්ථානය (NHTRC) අමතන්න:**

   - ඔබේ ප්‍රදේශයේ සේවා සපයන්නකු සමඟ සම්බන්ධ වී උපකාර ලබා ගැනීමට
   - සිදු විය හැකි මිනිස් ජාවාරම පිළිබඳ ක්‍රියාවක් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට; හෝ
   - පුහුණුව, තාක්ෂණික සහාය, හෝ සම්පත් ඉල්ලා සිටීමෙන් වැඩි දුර ඉගෙන ගැනීමට.

   NHTRC යනු රටෙහි ඕනෑම ස්ථානයක සිට ලැබෙන ඇමතුම් වලට, දිනකට පැය 24 පුරාවටම, සතියක දින 7 දීම, අවුරුද්දේ සෑම දිනකම පිළිතුරු ලබා දීමට භාවිතා කළ හැකි ජාතික, ගාස්තු අය නොකෙරෙන සෘජු දුරකථන මාර්ගයකි. NHTRC ආයතනය, නීතිය බලාත්මක කිරීමේ ආයතනයක් හෝ ආගමන අධිකාරියක් නොවන අතර, රාජ්‍ය නොවන සංවිධානයක් මගින් මෙහෙයවනු ලබයි.

3. ඔබේ ප්‍රදේශයේ හෝම්ලැන්ඩ් සිකියුරිටි ඉන්වෙස්ටිගේෂන්ස් HSI පිළිබඳව දැන  ගන්න. ඔබේ ප්‍රදේශයේ, මිනිස් ජාවාරම සම්බන්ධයෙන් කටයුතු කරන HSI විශේෂ නියෝජිතවරුන් සහ වංචාවට ගොදුරු වූවන්ට උපකාර සපයන විශේෂඥයින් හා සම්බන්ධ වීමටHSI හෝඩුවාවන් දුරකථන අංකය අමතා, එකට එක් වී පරීක්ෂා කළ හැකි අවස්ථාවක් ඇති වීමට පෙර, ඔවුන් සමඟ සම්බන්ධතාවක් ඇති කර ගන්න. ලැබෙන හෝඩුවාවන් සමඟ කටයුතු කිරීම සඳහා සහ ඒ පිළිබඳ තොරතුරු සහ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමට සහයෝගිත්වය දක්වන්න.

4. **ඔබේ ප්‍රදේශයේ කාර්ය බලකාය හඳුනාගන්න.** මිනිස් ජාවාරම පිළිබඳ කාර්ය බලකායන්ට, ෆෙඩරල්, රාජ්‍ය, දේශීය, රට සහ ගෝත්‍රික නීති බලාත්මක කරනු ලබන පුද්ගලයින් සහ නඩු පවරන්නන් මෙන්ම කූටනයට ගොදුරු වූවන්ට සේවා සපයන රාජ්‍ය නොවන සංවිධාන අයත් වේ. *www.bja.gov*වෙත පිවිස, ඔබේ ප්‍රදේශයේ මිනිස් ජාවාරම පිළිබඳ කාර්ය බලකායක් තිබේ දැයි සොයා බලන්න. එම ආයතනයක් තිබෙන්නේ නම්, ඒ හා සම්බන්ධතාවක් ඇති කර ගෙන ඔවුන්ගේ උත්සාහයන් සමඟ එක් වන්න.

5. **ඔබවත් ඔබේ සම¯සේවකයින් දැනුවත් කරන්න·** ඔබ නීතිය බලාත්මක කිරීම හා කටයුතු කරන්නෙකු නම්' අපගේ නොමිලේ සපයන පරිගණක පදනම්' අන්තර් ක්‍රියා සහිත පුහුණුවීම තුළින්' වඩාත් කාර්යක්ෂම වීම උදෙසා විවිධ සම්මුඛ සාකච්ඡා පවත්වන සහ පරීක්ෂක උපාය මාර්ගයන් ගැන ඉගෙන ගත හැකිය· *www.fletc.gov/training/programs/human-trafficking-training-program*වෙත පිවිසෙන්න· ඔබ පළමු වරට ප්‍රතිචාර දක්වන්නකු හෝ සෞඛ්‍ය සේවා සපයන්නකු නම්' අපගේ මාර්ගගත' සාමාන්‍ය අන්තර් ක්‍රියා පුහුණුව ලබා ගෙන අපගේ පළමු වරට ප්‍රතිචාර දක්වන්නන් සඳහා වූ වීඩියෝ පටිය නරඹන්න· *www.dhs.gov/Bluecampaign*වෙත පිවිසෙන්න.

6. **Blue Campaign** වෙබ් අඩවිය වෙත යන්න. මිනිස් ජාවාරම නතර කළ හැකි සටනට එක් විය හැකි අන්දම පිළිබඳ තොරතුරු දැන ගැනීමටත් වැඩි පුහුණුවක් ලබා ගැනීමටත්, බාහිරව ළඟා වීම සම්බන්ධ ද්‍රව්‍ය, ගොදුරු වූවන්ට ආධාර කළ හැකි ද්‍රව්‍ය සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න: *www.dhs.gov/bluecampaign*ෆේස්බුක් හි අපව "Like" කරන්න: *www.facebook.com/bluecampaign* හෝ *BlueCampaign@hq.dhs.gov*හි දී අප සමඟ එක්වන්න.

මිනිස් ජාවාරමට ගොදුරු වූ තැනැත්තන් හඳුනා ගැනීම
නීතිය බලාත්මක කිරීම, පළමු වග උත්තරකරුවන්, සහ සෞඛ්‍ය ආරක්ෂණ වෘත්තිකයින්



# ඔබට කළ හැක්කේ කුමක්ද?

*ගොදුරු වූවන් හඳුනා ගැනීම සහ මිනිස් ජාවාරම පිළිබඳ සැක සහිත අවස්ථාවන් වාර්තා කිරීමයි*

BLUE CAMPAIGN
One Voice. One Mission. End Human Trafficking.

# ඔබට කළ හැක්කේ කුමක්ද?

## *ගොදුරු වූවන් හඳුනා ගැනීම සහ මිනිස් ජාවාරම පිළිබඳ සැක සහිත අවස්ථාවන් වාර්තා කිරීමයි*

## වංචාවට ගොදුරු වූ තැනැත්තා ඔබට පෙනෙන ස්ථානයක සිටියි

ඔබේ රාජකාරිය අතරතුරදී, මිනිස් ජාවාරමට ලක් විය හැකි පුද්ගලයෙකු ඔබට මුණ ගැසීමට ඉඩ ඇත. මිනිස් ජාවාරමට ගොදුරු වූවන් අපගේ ප්‍රජාවන් තුළ සිටිති. ගෘහස්ථ කලබල සඳහා ලැබුණු ඇමතුමකදී නීති බලාත්මක කරන පුද්ගලයින්ට මෙවැනි කූටනයට ගොදුරු වූවන් හමු වීමට ඉඩ ඇත. සම්භාහන මධ්‍යස්ථාන, බාර් සහ ස්ට්‍රිප් ක්ලබ් වලින් ලැබෙන ඇමතුම් වලට ප්‍රතිචාර දක්වන අවස්ථාවන් වලදි; එසේ නැතිනම් සාමාන්‍යයෙන් සිදු කරන රථවාහන ගමනාගමන පරීක්ෂණ වලදී, හදිසි අවස්ථාවන්හිදී හෝ රෝහල් වල හෝ වෛද්‍යවරුන්ගේ කාර්යාල වල රෝගීන්ට ප්‍රතිකාර කරන අතරතුර පළමු වරට ප්‍රතිචාර දක්වන අය මෙන්ම සෞඛ්‍ය සේවා වෘත්තිකයින්ටද මේවා පිළිබඳ සංඥා දැකීමට ඉඩ තිබේ. සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ පරීක්ෂකවරුන්, මෙවැනි වංචනයට ගොදුරු වූ පුද්ගලයින්, ආපන ශාලා වල, කර්මාන්ත ශාලා වල, ඉදි කිරීම් වැඩ බිම් වල හෝ ගොවිපල වල සේවයේ යෙදී සිටින අවස්ථා වලදී සොයා ගැනීමට හැකිය.

## වංචාවට ගොදුරු වූ අය, ඕනෑම වයසක, ජාතියක, ස්ත්‍රී හෝ පුරුෂභාවයක හෝ එක්සත් ජනපද පුරවැසියන් ඇතුළුව, ජාතියක විය හැකිය.

ඔවුනට, නීතිමය ආගමනික තත්ත්වයක් තිබිය හෝ නොතිබිය හැකිය. වංචාවට ගොදුරු වූවන්, නීත්‍යානුකූල සහ නීත්‍යානුකූල නොවන කම්කරු අංශ වල සිටිය හැකිය; ඇතැමුන් ව පොළඹවා ගනු ලබන්නේ හොඳ වැටුප් ලබා දෙන රැකියා වැනි ව්‍යාජ පොරොන්දු ලබා දීමෙන් හෝ සමහර විට ආදරය සම්බන්ධ කර ගෙනයි. ඔවුන්, බොහෝ විට, බලෙන් හෝ බලාත්කාරකම් කරමින් ගෘහ සේවයට, ගොවිපලක හෝ කර්මාන්ත ශාලාවක සේවයට හෝ වෙනත් බලාත්කාරයෙන් ශ්‍රමය ලබා ගන්නා සේවාවන් සඳහා හෝ වාණිජ ලිංගිකත්වය (ගණිකා වෘත්තිය) සඳහා යොදා ගැනේ. ෆෙඩරල් නීතිය යටතේ, වාණිජ ලිංගික ක්‍රියාවන් වල යෙදීමට පොළඹවනු ලැබූ සෑම බාල වයස්කාර කෙනෙකුම, මිනිස් ජාවාරමට ගොදුරු වූ අයෙකි.

## මිනිස් ජාවාරමේ යෙදෙන පුද්ගලයින් ක්‍රියාකරන ආකාරය

සමාජ ආරක්ෂාව නොමැති හෝ සුළු වශයෙන් පමණක් ඇති පුද්ගලයින්, මිනිස් ජාවාරමේ යෙදෙන අය විසින් ගොදුරන් බවට පත් කර ගනී. ආර්ථික අපහසුතා, නිවස තුළ ප්‍රචණ්ඩත්වය, ස්වාභාවික ව්‍යසන, හෝ දේශපාලනික අස්ථාවරත්වය ඇතුළුව, විවිධ හේතූන් නිසා වඩාත් අනතුරකට භාජනය විය හැකි පුද්ගලයින් මොවුන් සොයති. මිනිස් ජාවාරමේ යෙදෙන පුද්ගලයින්, ජනතාව සිය උගුල් වලට හසු කර ගැනීමට හෝ වහල් කමට යොමු කරවීම සඳහා, ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ තර්ජන පමණක් නොව, මානසික බලාත්කාකම් වැනි විවිධාකාර උපාය ක්‍රම භාවිතා කරති. මෙයින් සිතෙහි ඇති වන කම්පනය ඉතා දැඩි විය හැකි අතර, ඔවුන්, කූටනයට ගොදුරු වූවන් ලෙස තමන් හඳුනා නොගන්නා අතර, ඉතාමත් ප්‍රසිද්ධ පසුබිම් වලදී පවා හෝ සහාය නොපතයි.

මිනිස් ජාවාරම පිළිබඳ ප්‍රධාන දර්ශක හඳුනා ගැනීමෙන් ජීවිතයක් පවා බේරා ගත හැකිය. වංචාවට ගොදුරු වූවන් හඳුනා ගැනීමේ පළමු පියවර මෙය වේ. පහත ලැයිස්තුගත කර ඇති සියලුම දර්ශක සෑම මිනිස් ජාවාරම සිදු වූ අවස්ථාවකදීම දක්නට නොලැබිය හැකිය. යම් දර්ශකයක් දැකීමට තිබීම හෝ නොතිබීම මිනිස් ජාවාරම සිදු වීම සම්බන්ධයෙන් සාක්ෂි නොදරයි.

ඔබ නීතිය බලාත්මක කරන පුද්ගලයකු නම්, යම් අවස්ථාවක දී කරුණාකර, හෝම්ලැන්ඩ් සිකියුරිටි ඉන්වෙස්ටිගේෂන්ස් (HSI) හි ක්ෂේත්‍ර කාර්යාලයක් සමඟ හෝ ඔබේ ප්‍රදේශයේ මිනිස් ජාවාරම පිළිබඳ කාර්ය බලකාය සමඟ සම්බන්ධ වන්න. එවිට ඔබට සහයෝගිත්වයෙන් පරීක්ෂණයක් සම්බන්ධයෙන් කටයුතු කළ හැකි අතර, හෝඩුවාවක් පිළිබඳව ද වාර්තා කළ හැකිය. මිනිස් ජාවාරම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සහ ඊට සම්බන්ධ පුද්ගලයින් අත් අඩංගුවට ගැනීමේ වගකීම HSI සතු වේ. ඔබේ අධීක්ෂකයාට දැනුම් දීම පිළිබඳව හෝ නියමිත ප්‍රාදේශීය බලධාරීන් සම්බන්ධ කර ගැනීම පිළිබඳව සංවිධානයට විශේෂිත වූ, ඔබ අනුගමනය කළ යුතු ප්‍රෝටකෝලයක් තිබිය හැකිය. ඔබ පළමු වරට ප්‍රතිචාර දක්වන පුද්ගලයෙකු නම්, කරුණාකර හෝඩුවාවක් වාර්තා කරන්න. ඔබේත්, වංචාවට ගොදුරු වූ පුද්ගලයාගේත් ආරක්ෂාව අතිශයින් වැදගත් වේ. **ඔබ නීතිය බලාත්මක කරන පුද්ගලයකු නම් හැර, කිසි විටෙකත් මිනිස් ජාවාරමේ යෙදී සිටින සැකකරුවකු හා සෘජුව ගැටීමෙන් වළකින්න සහ වංචාවට ගොදුරු වූ තැනැත්තාට ඔබේ සැකය දැනෙන්නට ඉඩ නොහරින්න.**

**ශ්‍රමය හෝ සේවය පිළිබඳ දර්ශක**

- පුද්ගලයා එක් කාර්යයක් සඳහා බඳවා ගෙන බලාත්කාරයෙන් වෙනත් රැකියාවක නිරත ව සිටීද?
- පවතින බවට චෝදනා ලද ණය ගෙවා දැමීම සඳහා පුද්ගලයාගේ වැටුපට අමතර එකතු කිරීම් කරනවාද?
- ලිංගික ක්‍රියාවන් සිදු කිරීමට පුද්ගලයාට බල කර තිබේද? පුද්ගලයා, වාණිජ ලිංගිකත්වයේ යෙදෙන බාල වයස්කරුවෙක්ද?
- පුද්ගලයා, අධික ලෙස දීර්ඝ සහ/හෝ සාමාන්‍ය නොවන පැය ගණන් සේවය කරනවාද?
- ඔවුන් සිටින තත්ත්වයට හෝ කරන රැකියාවට සුදුසු පරිදි පුද්ගලයා ප්‍රමාණවත් ලෙස ඇඳුම් ඇඳ සිටීද?

පාලන දර්ශක

- පුද්ගලයාට ඔහුගේ හෝ ඇයගේ අනන්‍යතාවය ඔප්පු කරනු ලබන සහ ගමන් ලියකියවිලි තමා සතුව තිබේද? එසේ නැත්නම් එම ලියකියවිලි පාලනය කරන්නේ කවුරුන්ද?
- පුද්ගලයා සඳහන් කළ යුතු දේ ගැන පුහුණුවක් ලබා දී ඇති බව පෙනී යන්නේද? තත්ත්වය පාලනය කරනු ලබන කෙනෙකු සමඟ පුද්ගලයා රැඳී සිටින බව පෙනී යන්නේද?
- පුද්ගලයා හෝ ඔහුගේ පවුලට හානියක් සිදු කරන බවට තර්ජන ලැබී තිබේද?
- පුද්ගලයා, බියකරුව, බයාදු ලෙස හෝ යටහත් පහත්ව සිටින ස්වරූපයක් පෙන්නුම් කරයිද?
- රටින් නෙරපන බවට හෝ නීතිය ක්‍රියාත්මක කරන බවට පුද්ගලයාට තර්ජනය කොට තිබේද?
- පුද්ගලයා අන්දමන්ද වී සිටින බවක්, ව්‍යාකූලභාවයක් හෝ මානසික හෝ ශාරීරික අපහරණයට ලක් වී ඇති බවට සලකුණු දක්නට තිබේද?
- පුද්ගලයාට, නිදහසේ සිය පවුලේ අය හෝ මිතුරන් හා සම්බන්ධ විය හැකිද?
- පුද්ගලයාට නිදහසේ සමාජයේ සැරසැරීමට හෝ ආගමික සේවාවන් වලට සහභාගී වීමට අවසර තිබේද?

ජීවන තත්ත්වයන් පිළිබඳ දර්ශක

- පුද්ගලයාට පෞද්ගලික භාණ්ඩ නොමැති බවක් පෙනී යන්නේද සහ අස්ථාවර ජීවත් වීමේ තත්ත්වයක් ඇති බව පෙනෙන්ට තිබේද?
- එහා මෙහා යෑම සඳහා පුද්ගලයාට නිදහස තිබේද? ඔවුන් ජීවත් වන ස්ථානයෙන් නිදහසේ පිටවී යා හැකිද? අසාධාරණ ආකාරයේ ආරක්ෂක පියවර තිබේද?
- පුද්ගලයාට ආහාර, ජලය, නින්ද, වෛද්‍ය පහසුකම් හෝ ජීවිතයේ වෙනත් අවශ්‍යතාවයන් සපයා නොදී ඇති බව පෙනී යන්නේද?

ගමන් දර්ශක

- පුද්ගලයා තමන්ගේ අවසාන ගමනාන්තය ගැන දන්නේද? ඔවුන් එතැනට යන ආකාරය පිළිබඳව දැනුවත් ව සිටින්නේද?
- එම අවසාන ගමනාන්තයේදී හමුවන්නේ කවුරුන් දැයි ඔහු හෝ ඇය දන්නේද?
- තමාගේ නියම දෙමව්පියන් හෝ භාරකරුවකු නොවන තැනැත්තකු සමඟ දරුවා ගමනේ යෙදී සිටින්නේද?

වෛද්‍ය දර්ශක

- පුද්ගලයාට, කැළැල්, පිළිස්සීම්, විකෘත කිරීම්, හෝ ආසාදන තිබේද?
- පුද්ගලයාට ඔහුගේ හෝ ඇයගේ වෛද්‍ය ඉතිහාසය ගැන ප්‍රකාශ කිරීම වළක්වාලන බව හෝ සීමා කරන බව පෙනී යන්නේද?
- පුද්ගලයා, මූත්‍රා අපහසුතා, ශ්‍රෝණිය හා සම්බන්ධ කැක්කුම, ගර්භණීභාවය හෝ ගුදීය අපහසුතා වලින් පෙළෙන්නේද?
- පුද්ගලයා, නිදන්ගත පිට කොන්දේ කැක්කුම, ශ්‍රවණය, හෘදය වස්තුව හා සම්බන්ධ හෝ ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ ගැටළු වලින් පීඩා විඳින්නේද?
- පුද්ගලයාට දුර්වල පෙනීම හෝ දැස් වල ගැටළු තිබේද?
- පුද්ගලයා මන්ද පෝෂණයෙන් පෙළෙන්නේද නැත්නම් ඔහුට හෝ ඇයට බරපතල දන්තමය ගැටළු තිබේද?

BLUE CAMPAIGN
One Voice. One Mission. End Human Trafficking.